# රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

## SMIB හි වෘත්තීයමය අවස්ථා

ජාතියේ නිවාස බැංකුව වශයෙන් ප්‍රමුඛතාවය උසුලන SMIB තම ගනුදෙනුකරුවන්ට විවිධ පහසුකම් සැලසීමට සහ ඔවුන්ගේ තෘප්තිය වෙනුවෙන් විවිධ සේවා සැපයීමේ අරමුණින් දැනට කටයුතු සම්පාදනය කරනු ලබයි. ඒ අනුව කටයුතු කිරීම සඳහා මනා ක්‍රියාශීලී නායකත්ව භූමිකාවක් නිරූපණය කිරීමේ හැකියාව ඇති, ව්‍යාපාර අරමුණු සපුරාගැනීම සඳහා පූර්ණ කැපවීම සහ දායකත්වය ලබාදිය හැකි අදාළ සුදුසුකම් සහ පළපුරුද්ද ඇති අපේක්ෂකයින්ගෙන්, පහත සඳහන් තනතුර සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

## තොරතුරු තාක්ෂණ ජාලය සහ සන්නිවේදන විශ්ලේෂක / පරිපාලක

**ප්‍රධාන වගකීම්:**

- විශ්වසනීය සහ ආරක්ෂිත මෙහෙයුම් සැපයීම සඳහා බැංකුවේ LAN/WAN සහ අන්තර්ජාල පද්ධතියේ කාර්යක්ෂම සහ ඵලදායී කළමනාකරණය.
- ස්ථර ආරක්ෂණ ක්‍රියාකාරී නිර්මාණ ශිල්පයට අනුව ජාල යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම, සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම
- ඉතා ඉහළ ඉටුකර ගැනීමේ හැකියාව සහ ආපදා ප්‍රතිසාධන හැකියාව ගොඩනැගීම
- ක්‍රියාකාරී අධීක්ෂණය සහ කර්මාන්ත ප්‍රමිතීන්ට අනුකූලව ජාල ආරක්ෂාව සහතික කිරීම
- ජාල තොරතුරු ආරක්ෂණ තර්ජන මැඩපැවැත්වීම කළමනාකරණය කිරීම
- සැපයුම්කරුවන්ගේ සේවා, ක්‍රියාත්මක කිරීම පරිපාලනය කිරීම, නඩත්තු කිරීම සහ ආධාරක කොන්ත්‍රාත්තු / සේවා මට්ටමේ ගිවිසුම් කළමනාකරණය.
- දත්ත / හඬ ජාලය සඳහා ධාරිතාව සැලසුම් කිරීම, සෞඛ්‍ය පරීක්ෂණ අධීක්ෂණය සහ කළමනාකරණයට අයත් වාර්තා අධීක්ෂණය
- ආපදා අවස්ථාවලදී ඇතිවිය හැකි බලපෑම් අවම කිරීම සඳහා පද්ධති ප්‍රතිසාධන ක්‍රියාවලි සංවර්ධනය කිරීම.
- බැංකුවේ ස්ථාපිත තොරතුරු ආරක්ෂණ ප්‍රතිපත්තියට අනුගත වීම.
- තාක්ෂණික සහය සහ සහය ලබා දීමේ අරමුණින් විවිධ සම්පත් දායකයින්ගේ (උදා: නියාමකයින්, විගණකවරුන්, කළමනාකරණය, වෙළෙන්දන් සහ සේවා සපයන්නන් ආදිය) විමසීම්වලට මැනවින් ප්‍රතිචාර දැක්වීම.
- IBM, Unix, Linux, Solaris, Windows 2008, Windows 2012 සේවාදායක පරිපාලනය පිළිබඳ දැනුම.
- ජාල ගමන් මාර්ගයන් පිළිබඳ විශ්ලේෂණ පැවැත්වීම සහ මතු විය හැකි ගැටලු පිළිබඳව කල්තියා වාර්තා කිරීම.

**සුදුසුකම් සහ පළපුරුද්ද**

**සුදුසුකම්**

පිළිගත් විශ්වවිද්‍යාලයක පරිගණක විද්‍යාව පිළිබඳ උපාධියක් හෝ ගණිතය, සංඛ්‍යාලේඛන හෝ ඉලෙක්ට්‍රොනික විද්‍යාව පිළිබඳ උපාධියක් සමඟ පරිගණක පද්ධති සැලසුම් පිළිබඳ ඩිප්ලෝමාවක් (අවම වශයෙන් වසරක) හෝ ඊට සමාන සුදුසුකමක් ජාතික ව්‍යාපාර කළමනාකරණ ආයතනයෙන් හෝ පිළිගත් ආයතනයකින් ලබා තිබිය යුතුය.

**පළපුරුද්ද**

සමස්ත වශයෙන් වසර හතරක් (04) තොරතුරු තාක්ෂණය පිළිබඳ පළපුරුද්ද සහ ඉන් වසර දෙකක් (02) පිළිගත් ආයතනයක පද්ධති / ජාල පරිපාලකවරයෙකු පළපුරුද්ද තිබිය යුතුය. මෙම පළපුරුද්ද බැංකු හෝ පිළිගත් මූල්‍ය ආයතනයක වීම වඩාත් සුදුසු වේ.

**වේතන**

වැටුප් පරිමාණය: රු. 62,060 - 980 x 20 - 81,660 බැංකුව අනුමත දීමනා සමඟ (10% දීමනාව, ජීවන වියදම් සහ ගෙවල් කුලී දීමනාව).

**වයස**

අවුරුදු 40 ට නොවැඩි විය යුතුය (එසේ වුවත් රාජ්‍ය අංශයේ ආයාතනයක දැනටමත් සේවයේ නියුතු අය සඳහා මෙම වයස් සීමාව අදාළ නොවේ)

**පොදු කොන්දේසි:**

**තෝරාගැනීමේ ක්‍රමවේදය:** බඳවාගැනීම බැංකුවේ ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටිය අනුව

**අයදුම්පත් කැඳවීම:** තෝරාගැනීම සම්මුඛ පරීක්ෂණ මගිනි.

**අනෙකුත් වරප්‍රසාද:**

01. අර්ථ සාධක අරමුදල් වෙනුවෙන් සේවායෝජකයා විසින් 15% ක දායකත්වය සහ සේවකයා විසින් 10% ක දායකත්වය. සේවක භාරකාර අරමුදල වෙනුවෙන් සේවායෝජකයා විසින් ගෙවීම කරනු ඇත.
02. මාස දෙකක සම්පූර්ණ වැටුප ප්‍රසාද දීමනාව වශයෙන්.
03. සේවය ස්ථිර කිරීමෙන් පසු සහනදායී පොලී අනුපාත මත නිවාස ණය ලබාගැනීමේ හැකියාව.
04. බැංකුවේ වෛද්‍යාධාර ක්‍රමය යටතේ ප්‍රතිලාභ.
05. ලබා නොගත් අසනීප නිවාඩු මුදල් කර ගැනීම.

**අයදුම්පත් එවිය යුතු අවසන් දිනය: 2022.10.10**

**අයදුම් කළ යුතු ආකාරය:**

උනන්දුවක් දක්වන සුදුසුකම් සපිරි අයදුම්කරුවන් තමන්ගේ අයදුම්පත (CV), අධ්‍යාපනික/ වෘත්තීයමය සුදුසුකම් දක්වන ඡායා පිටපත් සහ තමන් ගැන තොරතුරු අසා දැනගත හැකි ඥාතීන් නොවන වෘත්තිකයින් දෙදෙනෙකුගේ නම්, ලිපිනයන් සහ සම්බන්ධ කරගත හැකි දුරකථන අංක සඳහන් කරමින් පහත දක්වා ඇති ඊමේල් ලිපිනය වෙත යොමු කළ යුතුය. ලැබෙන සෑම අයදුම්පතක්ම රහස්‍යභාවයෙන් යුතුව සලකා බලනු ලබන අතර කුමන අන්දමේ හෝ බලපෑමක් කරනු ලැබීම නුසුදුසුකමක් ලෙස සලකා ක්‍රියා කරනු ඇත. තෝරාගැනීමේ පදනම තීරණය කිරීම, බඳවා ගැනීම, කල් දැමීම හෝ අවලංගු කිරීම හෝ බඳවාගැනීම් පිළිබඳව නිර්ණායකයන් වෙනස් කිරීම, එවැනි ක්‍රියාවකට එළඹීමේ අයිතිය බැංකුව සතුය. බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වනු ඇත.

**අයදුම්පත් එවිය යුත්තේ careers@smib.lk හරහා පමණි.**